**වධහිංසාවට එරෙහි එක්සත් ජාතීන්ගේ කමිටුව**

# ශ්‍රී ලංකාව පිළිබඳ පස්වැනි වාරික වාර්තාවේ සමාප්ති නිරීක්ෂණ

## සංස්කරණය නොකළ පූර්ව පිටපත

1. ශ්‍රී ලංකාව පිළිබඳ පස්වැනි වාරික වාර්තාව (CAT/ C/LKA/5) 2016 නොවැම්බර් 15 සහ 16 දෙදින පැවති සිය 1472 වැනි සහ 1475 වැනි රැස්වීම් වාර වලදී (CAT/ C/SR.1472 සහ 1475) සමාලෝචනය කළ වධහිංසාවට එරෙහි එක්සත් ජාතීන්ගේ කමිටුව 2016 නොවැම්බර් 30 දින පැවති 1494 වැනි රැස්වීමේදී මේ සමාප්ති නිරීක්ෂණ සම්මත කරගන්නා ලදී.

### අ. හැඳින්වීම

2. ශ්‍රී ලංකාව පිළිබඳව ඉදිරිපත් කරනු ලබන පස්වැනි වාරික වාර්තාව සහ මතුකරන ලද කරුණු සම්බන්ධයෙන් දෙන ලද පිළිතුරුද (CAT/C/LKA/Q/5/Add.1) කමිටුව විසින් සාදරයෙන් පිළිගනු ලැබේ.

3. මෙම වාර්තාව සැලකිල්ලට ගන්නා අවස්ථාවේ දී රාජ්‍ය පාර්ශවය සමග කරන ලද සංවාදයද ඉන් අනතුරුව දෙන ලද අමතර ලිඛිත තොරතුරුද සම්බන්ධයෙන් කමිටුව ස්තුතිවන්ත වෙයි.

### ආ. සාධනීය ලක්ෂණ

4. පුද්ගලික සන්නිවේදන භාරගැනීමටත් ඒවා සැලකිල්ලට ගැනීමටත් කමිටුවේ යෝග්‍යතාව පිළිගනිමින්, සම්මුතියේ 22 වගන්තිය යටතේ 2016 අගෝස්තු 16 දින කරන ලද ප්‍රකාශනය ගැන කමිටුව ප්‍රසාදය පල කරයි. පහත දැක්වෙන අංගෝපාංග රාජ්‍ය පාර්ශවය විසින් නීතිගත කිරීම ද කමිටුවේ ප්‍රසාදයට හේතුවේ:

(අ) බලහත්කාර අතුරුදහන් කිරීමෙන් සියලු දෙනා ආරක්ෂා කිරීම සඳහා වන සම්මුතිය, 2016 මැයි.

(ආ) ආබාධිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සඳහා වන සම්මුතිය, 2016 පෙබරවාරි.

5. සම්මුතියට අදල ක්ෂේත්‍රවල රාජ්‍ය පාර්ශවය විසින් ගන්නා ලද පහත දැක්වෙන නෛතික සහ ප්‍රාමාණික පියවර කමිටුව සාදරයෙන් පිළිගනී:

(අ) පවුලේ සාමාජිකයන් ආගිය අතක් නොමැති බව ප්‍රකාශ කොට සිටින අයට ඒ වෙනුවෙන් නොමැති බවට සහතික ලබා ගත හැකි වන පරිදි 2016 අගෝස්තු 25 අංක 19 දරන “මරණ ලියාපදිංචි කිරීම සංශෝධනය (තාවකාලික විධිවිධාන)” පනත ක්‍රියාත්මක කිරීම;

(ආ) “අතුරුදහන් වුවන් පිළිබඳ කාර්යාලය” සම්බන්ධ 2016 අගෝස්තු 23 දින අංක 14 දරන පනත සම්මත කර ගැනීම;

(ඇ) ස්වාධීන කොමිසන් සභා කිහිපයක් පිහිටුවීමට මග පාදමින් ව්‍යවස්ථාදයක සභාව නැවත පිහිටුවා ලූ 19 වැනි ව්‍යවස්ථා සංශෝධනය 2015 මැයි 15 ද සම්මත කර ගැනීම;

(ඈ) 2015 මාර්තු 7 අංක 4 දරන “අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ට සහාය දීමේ හා ආරක්ෂා කිරීමේ පනත” ප්‍රකාශයට පත් කිරීම;

(ඉ) රඳවා ගනු ලබන පුද්ගලයන් නිසියාකාර ලියාපදිංචි නොකරන නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමට ඉඩ සලසන 2013 අංක 2/2013 දරන අපරාධ චක්‍රලේඛය සම්මත කර ගැනීම.

6. මානව හිමිකම් වඩාත් ආරක්ෂා කිරීමට මග පාදමින් තම ප්‍රතිපත්ති සහ කාර්ය පටිපාටි සංශෝධනය කිරීම සඳහාත්, සම්මුතිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, රාජ්‍ය පාර්ශවය විසින් කරන ලද මුල පිරීම් කමිටුවේ සැලකිල්ලට භාජනය වෙයි. විශේෂයෙන්:

(අ) සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලි සහ යාන්ත්‍රණ සම්බන්ධයෙන් ජාතික ප්‍රවිචාරණයක් පැවැත්වීම සඳහා 2016 ජනවාරියේ කාර්ය සාධක බලකායක් පත් කිරීම සහ 2015 නොවැම්බරයේ සංහිඳියා යාන්ත්‍රණ සම්බන්ධීකරණය සඳහා කාර්යාංශයක් පිහිටුවීම;

(ආ) වධහිංසාව වැලැක්වීම සඳහා පියවර ගැනීමට 2016 ජූලියේදී අන්තර්-ආයතනික කමිටුවක් පිහිටුවීම;

(ඇ) මානව හිමිකම් උල්ලංඝන වලට එරෙහිව දැඩි පියවර ගන්නා බව සඳහන් කරමින් යුද, නාවික හා ගුවන් හමුදපතිවරුන් විසින් 2016 අප්‍රේල් මාසයේදී නිවේදනයක් නිකුත් කිරීම;

(ඈ) ත්‍රස්තවාදය වැළක්වීමේ පනත යටතේ අත් අඩංගුවට ගන්නා ලද පුද්ගලයන්ගේ මූලික අයිතිවාසිකම් වලට ගරු කිරීම සහතික කරන ලෙසටත්, මානව හිමිකම් කොමිසමට සිය රාජකාරි කටයුතු කිරීම සඳහා සහාය වන ලෙසත්, ජනාධිපතිවරයා විසින් සන්නද්ධ හමුද වලට හා පොලිසියට 2016 ජුනි 17 දින නියෝග කිරීම;

(ඉ) “වධහිංසාව වැලැක්වීම” ද ඇතුලත් මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ නගා සිටුවීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලසුම (2011-2016) 2011 මැයි මාසයේදී සම්මත කර ගැනීම;

(ඊ) ලිංගික සහ ලිංගිකත්වය පදනම් කරගත් ප්‍රචණ්ඩතාව සම්බන්ධයෙන් පියවර ගැනීමට 2016 නොවැම්බරයේදී ප්‍රතිපත්ති රාමුවක් සහ ජාතික ක්‍රියාකාරී සැලැස්මක් (2016-2020) දියත් කිරීම.

7. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මණ්ඩලයේ ස්වාධීන විශේෂඥයන්ට රාජ්‍ය පාර්ශවය විසින් 2015 දෙසැම්බරයේ කරන ලද විවෘත ආරාධනය ගැන කමිටුව සිය ප්‍රසාදය පල කරයි. සමාලෝචනය කෙරෙන කාල වකවානුව තුලදී වධහිංසාව පිළිබඳ විශේෂ නියෝජිත, විනිශ්චයකාරවරුන් සහ නීතිඥයන් සම්බන්ධ විශේෂ නියෝජිත, බලහත්කාරයෙන් හෝ නොකැමැත්තෙන් අතුරුදහන් කිරීම් සම්බන්ධ ක්‍රියාකාරී කණ්ඩායම, සත්‍යය, යුක්තිය, හානි පූරණය සහ පුනරාවර්තනය වැලැක්වීම සඳහා වන විශේෂ නියෝජිත, සංක්‍රමණිකයන්ගේ මානව හිමිකම් පිළිබඳ විශේෂ නියෝජිත සහ අභ්‍යන්තර අවතැන් වුවන් ගේ මානව හිමිකම් පිළිබඳ විශේෂ නියෝජිත මෙන්ම මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් වරයාද රාජ්‍ය පාර්ශවය වෙත කළ සංචාර සම්බන්ධයෙන් කමිටුව සතුටු වෙයි.

## ඇ. අවධානයට ලක්වෙන ප්‍රධාන විෂය සහ නිර්දේශ

### පසුගිය වාර්තා චක්‍රයෙන් මතුවූ නොවිසඳුණු ගැටළු

8. පසු විපරම් ක්‍රියාවලිය සඳහා රාජ්‍ය පාර්ශවය අනුකූලතාව දැක්වීමත්, 2013 ජනවාරි 11 ද රාජ්‍ය පාර්ශවය විසින් ලිඛිත තොරතුරු සැපයීමත් (CAT/C/LKA/CO/3-4/Add.1), ස්තුති පූර්වකව සටහන් කරගන්නා අතරේම, පසු විපරම සඳහා මීට පෙර සමාප්ති නිරීක්ෂණ විසින් හඳුනා ගන්නා ලද නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම ගැන කමිටුව කනගාටුව පල කරයි. නම් වශයෙන් කියතොත්, මූලික නෛතික රැකවරණය (27-28 ඡේද), බලහත්කාරයෙන් ලබාගන්නා පාපොච්චාරණ (31-32 ඡේද), වධබන්ධන පිළිබඳ චෝදනා විමර්ශනය (19-20 ඡේද) සහ අතීත උල්ලංඝන සම්බන්ධ වගවීම (15-16 ඡේද) ඒවායි.

### පොලිස් අත් අඩංගුවේදී නිරන්තරයෙන් වධ දෙන බවට වන චෝදනා

9. සැක කෙරෙන වරදේ ස්වභාවය නොතකා වධ හිංසා කිරීම "එදිනෙදා අපරාධ පරීක්ෂණ වලදී, පොලිස් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සාතිශය බහුතර සිද්ධි සම්බන්ධයෙන් කරන සාමාන්‍ය කටයුත්තක්," බවට පත්වී ඇතැයි, ජාතික මූලාශ්‍ර වලින් මෙන්ම, වධහිංසාව සම්බන්ධ එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිතයා ද ඇතුළු එක්සත් ජාතීන්ගේ මූලාශ්‍ර කිහිපයකින් ද එක හා සමාන වාර්තා ලැබීම පිළිබඳව කමිටුවේ බරපතල අවධානය යොමුවී ඇත. අධිකරණ වරෙන්තුවක් නොමැතිව සැකකරුවන් අත් අඩංගුවට ගැනීම සඳහා පොලිසියට ඇති පුළුල් බලතල නිසා, පරීක්ෂණ පැවැත්වෙද්දී පුද්ගලයන් රඳවා තබා ගන්නා බියජනක වාතාවරණයක් යටතේ තොරතුරු හෙළි කර ගැනීමට මග පාද තිබීම ගැන කමිටුව අවධානය යොමු කර තිබේ. නිදහස අහිමි කරනු ලැබූ පළමු පැය කීපයේදී රැඳවියන් ලියාපදිංචි කිරීමට හෝ නීතිය විසින් නියම කර ඇති කාල රාමුව තුල මහේස්ත්‍රාත් වරයකු ඉදිරියට පැමිණවීමට හෝ පොලිස් පරීක්ෂකයන් පියවර නොගැනීම පිළිබඳ චෝදනා කමිටුව සැලකිල්ලට ගනී. ඒ කාල සීමාව වධහිංසා සිදුකිරීමට බොහෝ විට ඉඩ ලැබෙන අවස්ථාවකි. රඳවා තබා ගැනීමේ නෛතික භාවය පිළිබඳව ද, පොලිස් පරීක්ෂණ

පවත්වන ආකාරය පිළිබඳව ද ප්‍රමාණවත් අධීක්ෂණයක් නීතිපතිවරයා හෝ අධිකරණ පද්ධතිය විසින් හෝ සිදු කිරීම මගින් මේ පුරුද්ද වලක්වා ලීමට පියවර නොගැනීම ද අවධානයෙන් යුතුව සැලකිල්ලට ගෙන තිබේ. මේ අනුව ගත් කල නඩු විභාග කිරීමට පෙර නොමනා සැලකිල්ලට භාජන වීමට ඇති ඉඩකඩ ගැන නොවිමසාම, මහේස්ත්‍රාත් වරුන් සැක කරුවන් රිමාන්ඩ් ගත කර තැබීමට පොලිසිය කරන ඉල්ලීම් වලට බොහෝ විට ඉඩ සැලසීම පිළිබඳව වධහිංසාව පිළිබඳ විශේෂ නියෝජිතයා දක්වා ඇති අවධානය සම්බන්ධයෙන් කමිටුව ද එකඟතාව පල කරයි.

**10. කමිටුව රාජ්‍ය පාර්ශවයෙන් මෙසේ ඉල්ලා සිටී:**

**(අ) වරදක් කරමින් සිටියදී හැරුණුකොට වෙනත් අවස්ථාවකදී අත් අඩංගුවට ගැනීම සඳහා, පොලිසිය විසින් නීති බලධාරියකු විසින් නිකුත් කරන ලද අත් අඩංගුවට ගැනීමේ වරෙන්තුවක් ලබා ගත යුතු වන පරිදි අවශ්‍ය නීති සංශෝධන සිදු කිරීම;**

**(ආ) රඳවා ගෙන සිටින පුද්ගලයන් නීතිය විසින් පනවා ඇති කාල රාමුව තුලදී කඩිනමින් විනිසුරුවරයකු හමුවට ගෙන ඒම. මෙම කාලය පැය 48ක් නො ඉක්මවිය යුතුය;**

**(ඇ) අත් අඩංගුවට ගන්නා සියලුම පුද්ගලයන් ගන්නා ලද නිශ්චිත දිනය, වේලාව, රඳවාගන්නා හේතුව සහ අත් අඩංගුවට ගන්නා ලද ස්ථානය, අත් අඩංගුවට ගත් නිලධාරීන් විසින් ලේඛනගත කිරීම තහවුරු කළ යුතුය. රැඳවියන් ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය හරියාකාර පිළිපදින බව මැනවින් අධීක්ෂණය කළ යුතු අතර ඊට අනුකූලව කටයුතු නොකරන හෝ තම පහල නිලධාරීන් විසින් එසේ කරනු ලැබීම ගැන වග බලා නොගන්නා ඕනෑම නිලධාරියකුට දඬුවම් පැමිණවිය යුතුය;**

**(ඈ) විමර්ශන සිදු කරද්දී පොලිස් ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් පලදයී අභිචෝදක අධීක්ෂණයක් ස්ථාපිත කිරීම සහ පොලිස් ප්‍රශ්න කිරීම් වලදී ලබා ගන්නා කට උත්තර අපරාධ චෝදනා ඔප්පු කිරීම සඳහා වන කේන්ද්‍රීය අංගය කරගැනීමේ පුරුද්දේ අවසානයක් දැකීම සඳහා අපරාධ පරීක්ෂණ ක්‍රමවේදය වැඩිදියුණු කළ යුතුය;**

**(ඉ) තමන් හමුවට ගෙන එනු ලැබූ පුද්ගලයකු වධහිංසාවට හෝ පීඩාවට ගොදුරු කර ඇති බවට විශ්වාස කිරීමට හේතු ඇති බව පෙනී යන්නේ නම්, රඳවා තබාගෙන සිටියදී සලකන ලද ආකාරය පිළිබඳව රැඳවියාගෙන් විමසීමටත්, වෝහාරික පරීක්ෂණයක් නියම කිරීමටත් පැවරී ඇති රාජකාරි යුතුකම විනිශ්චයකාරවරුන් ට සිහිපත් කර දිය යුතුය. වධහිංසා කරනු ලැබීම පිළිබඳ චෝදනා නඩු විභාග පැවැත්වෙන විට මතු කෙරෙන අවස්ථාවලදී ඊට නිසියාකාර ප්‍රතිචාර දක්වන්නට අසමත් වන නඩුකාරයන්ද ඇතුළු නීතිය ක්‍රියාත්මක කිරීමේ රාජකාරියේ නිරත සියලුදෙනාම ඒ සම්බන්ධ වගකීමෙන් බැඳ තබන්නට නිසි බලධාරීන් පියවර ගත යුතුයි;**

**(ඊ) රැඳවියන්ගේ පුද්ගලිකත්වයේ අයිතියට, නැතිනම්, නීතිඥවරයා හෝ වෛද්‍යවරයා සමග කරන සාකච්ඡා වල රහස්‍යභාවයට, බාධා පැමිණෙන අවස්ථාවලදී හැර රඳවාගෙන සිටින සෑම ස්ථානයකම වීඩියෝ සෝදිසි උපකරණ සවි කළ යුතුය. ඒවායේ පටිගත කිරීම් සුරක්ෂිතව තැබිය යුතු අතර අවශ්‍ය විටෙක පරීක්ෂකයන්ට, රැඳවියන්ට හා නීතිඥයන්ට ලබා දිය යුතුය;**

**(උ) නඩු විභාගයට පෙර රඳවා ගැනීමේදී අත් අඩංගුවේ තබා නොගෙන විකල්ප විධික්‍රම අනුගමනය කිරීමට උනන්දු කරවීම.**

**"සුදු වෑන්" පැහැරගැනීම් සහ නිල නොවන රැඳවුම් ස්ථාන වල දී වද දීම් පිළිබඳ චෝදනා**

11. සන්නද්ධ ගැටුම අවසන්වීමෙන් පසු අවුරුදු වලදී දෙමළ පුද්ගලයන් "සුදු වෑන්" මගින් පැහැර ගැනීමේ පුරුද්ද දිගටම පවත්වාගෙන යන බවට විශ්වසනීය වාර්තා ලැබීම පිළිබඳව කමිටුවේ කනස්සල්ල පළවේ. මානව හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය (OHCHR) විසින් 2002 සිට 2011 දක්වා කාලය සම්බන්ධයෙන් පවත්වන ලද ශ්‍රී ලංකාව සම්බන්ධ විමර්ශනය (OISL) මගින්ද, වධහිංසා කරන ලද ස්ථාන හෝ වද දෙන තැන් වලට ගෙන යාමේ සංක්‍රමණ ස්ථාන හෝ ලෙසින් 2009 සහ 2015 අතර කාලය තුල නඩත්තු කෙරුනු තැන් 48ක් හඳුනාගෙන ඇති රාජ්‍ය නොවන සංවිධාන විසින්ද, එවැනි ක්‍රියාකාරකම් පිළිබඳව නගා ඇති චෝදනා කමිටුවේ සැලකිල්ලට භාජන වෙයි. එල්ටීටීඊ සංවිධානය සමග දුරස්ථ හෝ සම්බන්ධයක් ඇති බවට සැක කෙරෙන පුද්ගලයන් ගණනාවක් පැහැර ගෙන ගොස් කුරිරු වධ බන්ධනයට පත් කරන ලද බවට ලැබී ඇති තොරතුරු ද කමිටුව සැලකිල්ලට ගනී. මෙයින් බොහෝ අවස්ථාවලදී ලිංගික ප්‍රචණ්ඩතාව යොදා ගැනීමත් පිරිමින්ද, කාන්තාවන්ද ලිංගික දූෂණයට ගොදුරු කර ගැනීමත් සිදු කෙරේ. ලැබී ඇති තොරතුරු අනුව එවන් කටයුතු යුද හමුදාව සහ පොලිසිය යන දෙපාර්ශවයෙන්ම සිදු කරනු ලබන්නේ පවතින්නේයැයි පිළිගෙන නැති රැඳවුම් ස්ථාන වලදීය. නීතිය ක්‍රියාත්මක කිරීමේ මුලස්ථාන, හමුද හා අභ්‍යන්තර අවතැන් කඳවුරු සහ "පුනරුත්ථාපන මධ්‍යස්ථාන" මේවාට ඇතුලත් වේ. රහසිගත වද කඳවුරු හෝ රැඳවුම් මධ්‍යස්ථාන දැන් පවත්වාගෙන යන්නේ නැති බවට වන රාජ්‍ය පාර්ශවයේ ස්ථාවරය සටහන් කරගන්නා අතරේම, වධබන්ධන පිළිබඳ මේ මෑත චෝදනා විමර්ශනය කළේදැයි පැහැදිලි කිරීමට රාජ්‍ය පාර්ශවය අසමත් වීම කමිටුවේ පසුතැවිල්ලට හේතු වෙයි.

**12. ආරක්ෂක අංශ විසින් කරන ලද නීතිවිරෝධී රඳවා තබා ගැනීම්, වධහිංසා සහ ලිංගික ප්‍රචණ්ඩතා පිළිබඳ සියලුම චෝදනා වහාම, අපක්ෂපාතීව සහ පලදායී ලෙසින් ස්වාධීන ආයතනයක් මගින් විමර්ශනය කරන ලෙස කමිටුව රාජ්‍ය පාර්ශවයෙන් උදක්ම ඉල්ලා සිටී. ගැසට් කරන ලද සියලුම රැඳවුම් මධ්‍යස්ථාන වල පූර්ණ ලැයිස්තුවක් ප්‍රසිද්ධියට පත් කොට, තවමත් පවත්වාගෙන යන නිල නොවන ඒවා වසා දමා කිසිම අයකු නිල නොවන ලෙස රඳවා තබා නොගන්නා බවට සහතික කරන ලෙස කමිටුව රාජ්‍ය පාර්ශවයෙන් ඕනෑකමින් ඉල්ලා සිටී. එසේ රඳවා තබා ගැනීම සම්මුතිය සපුරාම උල්ලංඝනය කිරීමකි.**

**ආරක්ෂක අංශයේ ආයතනික ප්‍රතිසංස්කරණ**

13. යුද්ධයේ සහ ඉන් පසු කාල පරිච්ඡේදයේ ශ්‍රී ලංකාවේ ආරක්ෂක අංශ විසින් ව්‍යාප්ත ලෙසින් හෝ ආයතනගතව වධහිංසාව, බලහත්කාර අතුරුදහන් කිරීම් සහ වෙනත් බරපතල මානව හිමිකම් උල්ලංඝන සිදුකළ බවට ශ්‍රී ලංකාව සම්බන්ධ එක්සත් ජාතීන්ගේ විමර්ශනය (OISL) විසින් හෙළිකරගෙන ඇති බව සිත්හි තබා ගන්නා කමිටුව, ආරක්ෂක අංශයේ ආයතනික ප්‍රතිසංස්කරණයක් කිරීමට රාජ්‍ය පාර්ශවය අපොහොසත් වීම ගැන බරපතල සැලකිල්ල යොමු කරයි. ඒ අනුසාරයෙන් ගත් කල 2008 මාර්තු සිට 2009 ජූනි දක්වා කාලය තුල අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ (CID) නියෝජ්‍ය පොලිස්පති වශයෙන් කටයුතු කළ වර්තමාන බුද්ධි අංශ ප්‍රධානී සිසිර මෙන්ඩිස් ශ්‍රී ලංකා නියෝජිත පිරිසේ සාමාජිකයකු වශයෙන් පැමිණ සිටිනු දැකීම කමිටුව තැති ගැන්මට හේතුවිය. CID යේ හතරවැනි තට්ටුව වධහිංසා පැමිණවීම සම්බන්ධයෙන් කුප්‍රකට ස්ථානයක් බව සැලකිල්ලට ගන්නා OISL වාර්තාවේ මෙන්ඩිස් මහතාගේ නමද සඳහන් වනු කමිටුවේ අවධානයට යොමුවිය. 2009 ජූනි මාසය දක්වා ඔහු විසින් අධීක්ෂණ වගකීම උසුලන ලද බව පැවසෙන CID සහ ත්‍රස්ත විමර්ශන ඒකකයේ (TID) නිලධාරීන් විසින් යුද්ධයෙන් පසුව මැණික්ෆාම් කඳවුරේ සහ වෙනත් ස්ථාන වල රඳවා තබාගෙන සිටි පුද්ගලයන්ට විරුද්ධව ලිංගික ප්‍රචණ්ඩතා ඇතුළු වධහිංසා පුළුල් ලෙස සිදුකළ බවට වන විස්තර රැගත් චෝදනා ද OISL වාර්තාවේ සඳහන් වෙයි. මේ සම්බන්ධයෙන් ගත් කල, කමිටුව විසින් මතු කරන ලද නිශ්චිත ප්‍රශ්න ගණනාවක් සම්බන්ධයෙන් මෙන්ඩිස් මහතා හෝ නියෝජිත පිරිසේ වෙනත් සාමාජිකයකු හෝ මෙන්ම රාජ්‍ය පාර්ශවය විසින් කමිටුවට සපයන ලද අමතර ලිඛිත තොරතුරු මගින් ද පිළිතුරු සපයා නැති වීම කමිටුවේ බලවත් කනගාටුවට හේතු වෙයි.

**14. රාජ්‍ය පාර්ශවය පහත කටයුතු ඉටු කළ යුතුව ඇත:**

**(අ) ආරක්ෂක අංශයේ ආයතනික ප්‍රතිසංස්කරණයක් වහාම ආරම්භ කළ යුතු අතර, ඉහල නිලවල වේවා, පහල නිලවල වේවා කිසියම් හමුදා හා ආරක්ෂක අංශ නිලධාරියකු හෝ රජයේ නිලධාරියකු හෝ මානව හිමිකම් උල්ලංඝන වලට සම්බන්ධ බවට පිළිගැනීමට යුක්ති සහගත හේතු සාධක වේ නම්, OISL වාර්තාවෙන්ද නිර්දේශ කර ඇති පරිදි, ඔවුන් නිලයෙන් පහ කිරීම සඳහා සුලමුල සෙවීමේ කාර්යදාමයක් ස්ථාපිත කර ගත යුතුය;**

**(ආ) මෙන්ඩිස් මහතා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පති වශයෙන් රාජකාරි කරන කාලයේ වධහිංසා පැමිණවීම් පිළිබඳව එල්ලවී තිබෙන චෝදනා වලට අදළව ඔහුගේ කාර්යභාරය සහ වගකීම් පිළිබඳ සවිස්තර තොරතුරු ලබා දිය යුතුය.**

**වධහිංසා සහ අතුරුදහන් කිරීම් පිළිබඳ අතීත සිද්ධි සම්බන්ධයෙන් වගවීම සහතික කිරීම**

15. අභ්‍යන්තර ගැටුම සමයේත් එය අවසන් වූ සැනිනුත් ව්‍යාප්ත ලෙසින් සිදුවූ මානව හිමිකම් උල්ලංඝන සම්බන්ධයෙන් පියවර ගැනීම සඳහා වන කැපවීම

පෙන්නුම් කරමින් ශ්‍රී ලංකාවේ සංහිඳියාව, වගවීම සහ මානව හිමිකම් නගා සිටුවීම සඳහා වන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මණ්ඩලයේ 30/1 යෝජනාව ගෙන ඒමට හවුල් වීම පිළිබඳව ප්‍රසාදය පල කරන කමිටුව රාජ්‍ය පාර්ශවය ජාතික ප්‍රචාරණ කටයුතු අවසන් කළේ මේ දැන් බවත්, එම යෝජනාවෙන් ඉල්ලා සිටින ආයතන පිහිටුවා නැති වීම ගැන සටහන් කරගනියි. විශේෂ නීති උපදේශක වරයකුගෙන් සමන්විත නීති යාන්ත්‍රණයක් මෙන්ම සත්‍යය, යුක්තිය, සංහිඳියාව සහ පුනරාවර්තනය වැලැක්වීම සඳහා වන කොමිසමක් සහ හානි පූරණය සඳහා වන කාර්යාලයක් එහිදී සුවිශේෂ වෙයි. යුද සමයේ සිදුවූ “ත්‍රිකුණාමල පංච සිසු ඝාතනය” සහ අක්ෂෝන් කොන්ත්‍ර ල ෆේම් (Action Contra la Faim) ස්වේච්ඡා සේවකයන් 17 දෙනාගේ ඝාතනය ඇතුළු යුද සමයේ මානව හිමිකම් උල්ලංඝන පිළිබඳ ඇතැම් සංකේතාත්මක සිදුවීම් සම්බන්ධ පරීක්ෂණ අවසන් නොවී තිබීම ද කමිටුව කනගාටුවෙන් යුතුව සටහන් කරයි. මේ දෙකම සිදුවූයේ 2006 දීය. මීට අමතරව, 2015 දී අවසන් වූ විශ්වමඩු සිද්ධිය සම්බන්ධයෙන් බරපතල දඬුවම් පනවා ඇති බව සටහන් කරන අතර, යුද්ධයෙන් පසුව ආරක්ෂක අංශ විසින් සිදු කරන ලද බවට චෝදනා කෙරෙන ලිංගික දූෂණ සහ ලිංගික ප්‍රචණ්ඩතා පිළිබඳව ආරම්භ කර ඇතැයි රාජ්‍ය පාර්ශවය විසින් වාර්තා කරන ලද විමර්ශන 39 ක් සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු ලබා දීමට අසමත් වීම ගැන කමිටුව කනගාටුව පල කරයි. සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණ වැඩිදියුණු කරගන්නා තුරු අධිකරණයේ ඇති අදළ අපරාධ විමර්ශන අත්හිටුවීම නොකළ යුතු බවට මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරයා 2016 පෙබරවාරියේ රාජ්‍ය පාර්ශවය හමුවට ගිය අවස්ථාවේ මේ සම්බන්ධයෙන් පල කළ අදහස් සමග කමිටුව එකඟ වෙයි.

16. **මානව හිමිකම් මණ්ඩලයේ 30/1 යෝජනාවෙන් ඉල්ලා ඇති ආකාරයේ යාන්ත්‍රණයක් පිහිටුවීම රාජ්‍ය පාර්ශවය කඩිනමින් සිදුකළ යුතුය. මෙහිදී, වධහිංසා, බලහත්කාර අතුරුදහන් කිරීම් සහ වෙනත් බරපතල මානව හිමිකම් උල්ලංඝන විභාග කිරීම සඳහා අවංක කම සහ අපක්ෂපාතී භාවය පිළිබඳව දේශීය හා ජාත්‍යන්තර මට්ටමින් පිළිගැනීමට පාත්‍රවූ පුද්ගලයන්ගේ නායකත්වයෙන් යුත් ස්වාධීන අධිකරණ හා අභිචෝදක යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම විශේෂිත වෙයි. යුද සමයේත්, ඉන් අනතුරුවත් කරන ලද බරපතල මානව හිමිකම් උල්ලංඝන සම්බන්ධයෙන් විසඳී නැති අපරාධ පිළිබඳව කෙරෙන පරීක්ෂණ සිතියම් ගත කිරීම රාජ්‍ය පාර්ශවය විසින් සිදු කළ යුතුය. එමෙන්ම, එවැනි සිද්ධි ලේඛනගත කොට ඇති ජනාධිපති කොමිසම් වල සොයාගැනීම් ද සිතියම් ගත කොට, කඩිනම්, පරිපූර්ණ සහ ස්වාධීන විමර්ශන පවත්වා සත්‍යය හෙළි කොට ගෙන සෘජුව හෝ අණදෙන්නන් හෝ ඉහල බලධාරීන් ලෙසින් හෝ වගකිවයුත්තන්ගේ වගවීම සහතික කළ යුතුය.**

## වධදීමේ සිද්ධි වලට සම්බන්ධ වින්දිතයන් සහ සාක්ෂිකරුවන්ගෙන් පළි ගැනීම

17. වධ හිංසා කිරීම් පිළිබඳ ව පොලිසියට පැමිණිලි කළහොත් පළි ගනු ලබනු ඇතැයි තිබෙන බිය නිසා වින්දිතයන් පසුබට වීම ගැන ලැබී ඇති තොරතුරු සම්බන්ධයෙන් කමිටුවේ අවධානය යොමුවී ඇත. මේ සම්බන්ධයෙන් ගත් කල, වධහිංසාවට ගොදුරුවූවන් හෝ සාක්ෂිකරුවන්ට එරෙහි පළිගැනීම් පිළිබඳව රාජ්‍ය පාර්ශවයට ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව හෝ ඒ පැමිණිලි සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂණ පිළිබඳව හෝ සංඛ්‍යාලේඛනමය දත්ත නොමැති වීම ගැන කමිටුව කනගාටුව පල කරයි. අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ 2015 අංක 4 දරන පනත සම්මත කරගැනීම අගයන අතරම, වධබන්ධනය සම්බන්ධයෙන් වඩාත් චෝදනා ලබන ආයතනය පොලිසිය වී තිබියදීත්, පොලිසියේම ආයතනික ධුරාවලිය යටතේ වින්දිතයන් සහ සාක්ෂිකරුවන් පිළිබඳ අංශය පිහිටුවාලීමට යෝජනා කර තිබීම කමිටුවේ අවධානයට යොමුවී ඇත.

18. **නිදහස අහිමි කරනු ලැබූ පුද්ගලයන්ද ඇතුළුව, වධහිංසාවට ගොදුරු වූවන් වෙනුවෙන් ස්වාධීන, ප්‍රතිපලදයක සහ පහසුවෙන් ප්‍රවේශවිය හැකි පැමිණිලි කිරීමේ යාන්ත්‍රණයක් පිහිටුවා, පළිගැනීමට ලක්වීමේ අන්තරායකින් තොරව පැමිණිලි කිරීමේ හැකියාව රාජ්‍ය පාර්ශවය විසින් සහතික කර ලිය යුතුය. වධහිංසාව, ලිංගික ප්‍රචණ්ඩතාව හෝ මිනිස් ජාවාරමට ගොදුරු වූවන්ද ඇතුළු මානව හිමිකම් උල්ලංඝන වලට ගොදුරු වුවන් සහ ඒ පිළිබඳ සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සහ ඔවුන්ට ලැබෙන සහාය නිසියාකාර සැලසෙන පරිදි අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත සංශෝධනය කළ යුතුය. එහිදී, ආරක්ෂාව පිළිබඳ අංශය පොලිස් ධුරාවලියෙන් ස්වාධීන වූ ආයතනයක් බවට පත් කිරීමත්, එහි සාමාජිකයන් සම්පූර්ණයෙන්ම පූර්ව සෝදිසියකට ලක් කිරීමත් සහතික කළ යුතුය. වධහිංසාවට ගොදුරු වුවන් සහ ඒ පිළිබඳ සාක්ෂි කරුවන්ට තර්ජනය කරන හෝ ඔවුන්ගෙන් පළිගැනීම හෝ සම්බන්ධයෙන් වගකිව යුතු පොලිස් නිලධාරීන් ට විරුද්ධව අපරාධ නීතිය යටතේත්, විනයානුකූලවත් රාජ්‍ය පාර්ශවය වහාම පියවර ගත යුතුය.**

## වධහිංසාව සහ නොමනා සැලකිලි සම්බන්ධ චෝදනා පිළිබඳව ප්‍රමාණවත් පරීක්ෂණ නොකිරීම

19. එක්සත් ජාතීන් ඇතුළු රාජ්‍ය නොවන මූලාශ්‍ර ගණනාවකින් ලැබෙන වාර්තාවල දැක්වෙන පරිදි රාජ්‍ය පාර්ශවයේ වධහිංසා පිළිබඳ සිද්ධි බොහොමයක් සම්බන්ධයෙන්ද දණ්ඩ මුක්තිය රජ කිරීම ගැන කමිටුව දැඩි කම්පාවට පත්ව සිටී. වධහිංසාවට එරෙහි සම්මුතිය යටතේ 2012 පටන් පවරා ඇති නඩු සංඛ්‍යාව 17ක් පමණක් වීමත් එයින් වරදකරුවන් වී ඇත්තේ සිද්ධි දෙකක් සම්බන්ධයෙන් පමණක් වීමත් කමිටුවේ සැලකිල්ලට භාජන වී තිබේ. මෙයින් ඇඟවෙන්නේ සැබවින්ම පරීක්ෂණ පවත්වා ඇත්තේ වධ හිංසා පැමිණවීම පිළිබඳ චෝදනා අල්ප ප්‍රමාණයක් ගැන බවයි. 2012 සිට එකම කාල වකවානුවක් තුල පොලිසියට ලැබී ඇති බවට

වාර්තාවන පැමිණිලි සංඛ්‍යාවේ අඩු කමත් (සිද්ධි 150), ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාවේ විශාලත්වයත් (සිද්ධි 2,259) අතර ඇති බරපතල වෙනස කමිටුවේ දැඩි සැලකිල්ලට ලක් වෙයි. වධහිංසා කිරීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසමට ලැබුණු චෝදනා පදනම් කොටගෙන ඔවුන් විසින් නීතිය ක්‍රියාවේ යොදවන නිලධාරීන්ට ලබාදුන් පැමිණිලි සම්බන්ධයෙන් කරන ලද නඩු පැවරීම් ගැන ඉල්ලා සිටින ලද තොරතුරු කමිටුවට ලැබුනේ නැත. මානව හිමිකම් කොමිසම තමන් වෙත ලැබෙන වධහිංසා පිළිබඳ  චෝදනා සියල්ල නීතිපති දෙපාර්තමේන්තුවට ලබා දුන්නත්, නිල බලයෙන් විභාග නොකරම එම පැමිණිලි නීතිපති දෙපාර්තමේන්තුව වැඩිදුර පරීක්ෂණ සඳහා පොලිසිය ට යොමු කිරීම කමිටුවේ අවධානයට ලක් වී තිබේ. එමෙන්ම, වධ හිංසා පැමිණවීමේ චෝදනා අභිචෝදකයන් විසින් සාමාන්‍යයෙන් නිලබලයෙන් විභාග නොකරන්නේයැයි රාජ්‍ය පාර්ශවය විසින් තහවුරු කරනු ලැබූ බවද කමිටුව සටහන් කර ගනී. වධහිංසා චෝදනා සම්බන්ධයෙන් අපක්ෂපාතී, සාර්ථක පරීක්ෂණයක් පැවැත්වීමේ ඉඩකඩට මේ ආයතනික වැඩ පිළිවෙලින් බාධා පමුණුවා ඇත. මන්ද, පොලිස් ධූරාවලිය යටතේම තිබෙන පොලිස් විශේෂ විමර්ශන ඒකකයට එම පරීක්ෂණ පැවැත්වීමේ වගකීම තනිකරම පැවරෙන හෙයිනි.

20. **නීතිය ක්‍රියාත්මක කිරීමේ රාජකාරියෙහි නිරත නිලධාරීන්ට එරෙහි පැමිණිලි විභාග කිරීම සඳහා පොලිස් ධූරාවලියෙන් ස්වාධීන වූ, ස්වාධීන ආයතනයක් පිහිටුවන ලෙස කලින් දෙන ලද නිර්දේශ (CAT/C/LKA/CO/3-4) කමිටුව නැවතත් අවධාරණය කරයි. වධබන්ධන සිද්ධීන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ වගකීම පැවරෙන අභිචෝදක අධිකාරියේ ස්වාධීනත්වය ශක්තිමත් කරන ලෙසත්, වධහිංසා පැමිණවීම් පිලිබඳ චෝදනා විභාග කිරීමේ හැකියාව අභිචෝදකයන්ට නිල බලයෙන්ම පැවරීම සම්බන්ධයෙන් සලකා බලන ලෙසත්, කමිටුව රාජ්‍ය පාර්ශවයෙන් ඉල්ලා සිටී. වධහිංසා කිරීම සම්බන්ධයෙන් චෝදනා ලබන පුද්ගලයන්ගේ විමර්ශන පැවැත්වෙන කාල සීමාව තුලදී වහාම ඔවුන්ගේ සේවය අත් හිටුවීමට රාජ්‍ය පාර්ශවය කටයුතු කළ යුතුය. විශේෂයෙන්ම, එසේ නොකළහොත් ඔවුන් චෝදනා කෙරෙන ආකාරයේ අපරාධයක් නැවතත් කිරීමේ, අපරාධයට ගොදුරු වූ අයගෙන් පලිගැනීමේ හෝ පරීක්ෂණ වලට බාධා කිරීමේ අවදනමක් තිබිය හැකි නිසාය. එමෙන්ම, වධහිංසාව සිදුකිරීම, ඊට අණදීම, ඊට අනුමැතිය පල කිරීම හෝ විරුද්ධ නොවී සිටීම යනාදියෙන් වගකීමෙන් බැඳෙන සියලුදෙනාට එරෙහිව චෝදනා ගොනුකොට, නඩු විමසා, වරදකරුවන් බවට තීන්දු වේනම්, ඔවුන්ගේ ක්‍රියාවේ බරපතල කමට සරිලන පරිදි දඬුවම් පැමිණවීම රාජ්‍ය පාර්ශවය විසින් සහතික කළ යුතුය.**

**ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පරිපාලන අත් අඩංගුවේ දීර්ඝ කාලයක් රඳවාගෙන සිටීම**

21. හදිසි තත්වය 2011 දී ඉවත් කරනු ලැබුවත්, 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පරිපාලන අත්අඩංගුවේ පුද්ගලයන් රඳවා තබා ගැනීම

එලෙසම සිදු කිරීම ගැන කමිටුවේ අවධානය යොමුව පවතී. සැකකරුවන් මහේස්ත්‍රාත් වරයකු හමුවට ගෙන ඒමට පළමු, ආරක්ෂක අමාත්‍යවරයා විසින් තීරණය කරන ලද ස්ථානයක හා කොන්දේසි යටතේ පැය 72ක් දක්වාත්, ඉන් අනතුරුව මාස 18ක් දක්වාත් මේ නීතිය අනුව රඳවා තබා ගත හැකිය. ආරක්ෂක අමාත්‍යවරයාගේ තීරණය අධිකරණයේ අභියෝගයට ලක් කළ නොහැක. ත්‍රස්තවාදය වැළක්වීමේ පනත යටතේ සැකකරුවන් නඩු නැතිව අවුරුදු 15ක් තරම් දීර්ඝ කාලයක් රඳවා තබාගෙන සිටීමත්, නඩු පවරන ලද්දවුන් පවා තීන්දුවකින් තොරව අවුරුදු 14ක් තරම් කාලයක් සිරගත කොට සිටීමත් කමිටුවේ අවධානයට ලක් වී තිබේ. ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ රඳවා තබාගෙන සිටියාවූද, සිටින්නාවූද අය වධහිංසාවට භාජන වූ බවට වන චෝදනා විශාල සංඛ්‍යාවක් ලේඛනගත වී තිබීමද, නිසි කාර්ය පටිපාටිය සඳහා වන ඔවුන්ගේ අයිතියට අවහිර පැමිණවීම ගැන චෝදනා ද, කමිටුවේ අවධානයට ලක්වී තිබේ. මෙහිදී නීතිඥයන් හමුවීම ට බාධා පැමිණවීම විශේෂිතය. ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත වෙනුවට ප්‍රතිපත්ති කෙටුම්පතක් සහ නීතිමය රාමුවක් ආණ්ඩුව විසින් යෝජනා කර ඇති බව සටහන් කරගන්නා අතරේම, ත්‍රස්තවාදයට අදළ වැරදි වල විෂය පථය, හිතුමතේ අත්අඩංගුවට ගැනීම වළක්වාලීම සඳහා වන රක්ෂාවරණ සහ රැඳවුමේ දී නෛතික අධීක්ෂණය ආදී නිශ්චිත කාරනා සම්බන්ධයෙන් රජයේ නියෝජිත මණ්ඩලය විසින් තොරතුරු ලබා නොදීම ගැන කමිටුව කනගාටු වෙයි. හරියාකාර රක්ෂාවරණයක් ලබාගැනීමේ හැකියාවෙන් හා නෛතික අධීක්ෂණයකින් තොරව, දීර්ඝකාලීන රැඳවුමේ නිරන්තර ප්‍රශ්න කිරීම සඳහා විමර්ශක බලධාරීන්ගේ අත් අඩංගුවේ සැකකරුවන් රඳවා තබන්නාවූ කවර තන්ත්‍රයක් වුව වධබන්ධන කිරීමේ සැබෑ අවදානමක් මතු කරන බවද, එහෙයින්ම සම්මුතියට පටහැනි වන බවද කමිටුව විසින් අවධාරණය කරනු ලැබේ.

22. **ත්‍රස්තවාදය වැළක්වීමේ පනත අවලංගු කිරීම සඳහා රාජ්‍ය පාර්ශවය කඩිනම් නෛතික පියවර ගත යුතු අතර, අපරාධ යුක්ති පද්ධතිය මගහැර පුද්ගලයන් සිරකොට තබාගැනීමටත්, අපහරණයට ගොදුරු වීමටත් මගපාදන පරිපාලන රැඳවුම් තන්ත්‍රය අහෝසි කර දැමිය යුතුය. ඒ අතරවාරයේ, ත්‍රස්තවාදය වැළක්වීමේ පනත යොදගෙන නිකුත් කර ඇති සියලුම රැඳවුම් නියෝග මහේස්ත්‍රාත්වරුන් ලවා වහාම පුනරීක්ෂණය කොට, අභිචෝදනා නැගිය යුතු රැඳවියන්ට හැකි ඉක්මනින් නඩු පවරා විභාග කොට, චෝදනා නැති හෝ නඩු පවරනු නොලබන අය නිදහස් කර යැවීමට වගබලා ගත යුතුය. ජාතික ආරක්ෂාව පිළිබඳ අනපනත් අවශ්‍ය යයි හැඟෙයි නම්, ත්‍රස්ත ක්‍රියා පිළිබඳ නිශ්චිත නිර්වචනයක් සම්මත කොටගෙන, විනිශ්චයකාරවරයකු හමුවට වහාම පැමිණවීමටත්, රැඳවුමේ ආරම්භයේ සිට නීතිඥවරයකු හමුවීමටත්, රැඳවියකු සතු අයිතිය තහවුරු කරමින්, රඳවා තබා ගැනීමේ අත්‍යාවශ්‍යකතාව සහ වරදට ඇති සමානුපාතිකතාව සහතික කරදී, රැඳවියා වහාම නිදහස් කිරීමේ හෝ විකල්පයක් නියම කිරීමේ හෝ බලය සහිත අධිකරණයක් විසින් කලින් කලට පුනරීක්ෂණයක් පැවැත්වීම මගින් රාජ්‍ය පාර්ශවය විසින් ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ප්‍රමිතීන් අනුගමනය කළ යුතුය.**

**බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්**

23. මෑතකදී සම්මත කළ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම පිළිබඳ සම්මුතිය රටේ නීතිය බවට පත් කිරීමට අවශ්‍ය ව්‍යවස්ථා සම්පාදනය සඳහා දරන උත්සාහය ඇතුළු කටයුතු මගින් ආගිය අතක් නොමැති දහස් සංඛ්‍යාත පුද්ගලයන්ගේ ඉරණම නිරවුල් කර ගැනීමට රාජ්‍ය පාර්ශවය වැඩි වැඩියෙන් කටයුතු කිරීම ගැන ප්‍රසාදය පල කරන අතරම, මිනී වල කැනීම සඳහා අවශ්‍ය තාක්ෂණික හැකියාව සහ වෝහාරික විශේෂඥ දැනුම අතුරුදහන් වුවන් පිළිබඳ  කාර්යාලය (OMP) වෙනුවෙන් සම්පාදනය කර දෙන්නේ කෙසේද යන්න පැහැදිලි නොකිරීම ගැන කමිටුව කනගාටුව පල කරයි. එමෙන්ම, බොහෝ අතුරුදහන් වීම් සහ වධහිංසාවට අදළ අපරාධ සිදුවූ බවට චෝදනා කෙරෙන ත්‍රිකුණාමල නාවික හමුද කඳවුරේ රහසිගත රැඳවුම් ස්ථානය සම්බන්ධයෙන් සිදුකෙරෙන විමර්ශන වල ප්‍රගතියක්, අපක්ෂපාතී බවක් සහ පලදායී කමක් නොමැති වීම පිළිබඳව අතුරුදහන් වීම් සම්බන්ධ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කණ්ඩායම විසින් රාජ්‍ය පාර්ශවය එරටදී හමුවීමෙන් අනතුරුව ලබා දී තිබෙන කම්පා කරවන සුළු තක්සේරුව ගැන කමිටුව සිය බලවත් අවධානය යොමුකරයි.

24 **බලහත්කාරයෙන් අතුරුදහන් කිරීමේ අපරාධයට දණ්ඩ මුක්තිය හිමිවීමට එරෙහිව සටන් වැදීම සඳහා අවශ්‍ය සියලුම පියවර රාජ්‍ය පාර්ශවය විසින් ගනු ලැබිය යුතුය. විශේෂයෙන් කළ යුතු දේ:**

**(අ) බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම අපරාධයක් බවට පත් කෙරෙන නීති සම්මත කරගැනීම වේගවත් කොට දඬුවම් පැමිණවීමේදී එවැනි අපරාධ වල බරපතල කම සැලකිල්ලට ගැනීම;**

**(ආ) ත්‍රිකුණාමල නාවික හමුද කඳවුර ඇතුළු ස්ථාන වලදී සිදු කෙරුනු බලහත්කාර අතුරුදහන් කිරීම් සහ වධහිංසන අංග සම්පුර්ණ ලෙස, කඩිනමින් හා ප්‍රතිපල ලැබෙන අන්දමින් ස්වාධීන යාන්ත්‍රණයකින් විමර්ශනය කොට, සැකකරුවන්ට නඩු පවරා, මිනිස් ශේෂ හමු නොවුනත්, වරදකරුවන් බවට තීරණය වෙන්නන් ගේ අපරාධයේ පරිමාණය අනුව  ඔවුන්ට දඬුවම් කිරීම;**

**(ඇ) වෝහාරික විශේෂඥතාව ද ඇතුළුව මිනී වල කැනීම් සඳහා අවශ්‍ය තාක්ෂණික ශක්‍යතාව අතුරුදහන් වුවන් පිළිබඳ කාර්යාලය (OMP) වෙත සම්පාදනය කිරීම;**

**(ඈ) බලහත්කාර අතුරුදහන් කිරීමක සෘජු ප්‍රතිපලයක් ලෙසින් හානි සිදුවූ ඕනෑම පුද්ගලයකුට අතුරුදහන් වූ තැනැත්තාට අත්වූ ඉරණම පිළිබඳ තොරතුරු දැන ගැනීමටත්, අවශ්‍ය මානසික, සමාජීය සහ මූල්‍යමය ආධාර ඇතුළු යුක්ති සහගත සහ ප්‍රමාණවත් වන්දියක් ලබා දීමටත් පියවර ගත යුතුය;**

**ත්‍රස්ත විරෝධී රාමුව තුල පුනරුත්ථාපනය**

25. හදිසි නීති රෙගුලාසි යටතේ පිහිටුවන ලද "පුනරුත්ථාපන" වැඩසටහන 2009 යුද්ධය අවසානයේ යුද හමුදවට භාරවූ එල්ටීටීඊය හා සම්බන්ධ පුද්ගලයන් වෙනුවෙන්

දිගටම පවත්වාගෙන යාම ගැන කමිටුවේ අවධානය යොමුවී තිබේ. මේ වරණය අධි චෝදනා භාරදී රිමාන්ඩ් භාරයේ ඉන්නා අයට පමණක් ස්වේච්ඡාවෙන් ලබාගත හැකි අවස්ථාවක් ලෙස නියෝජිත පිරිස විසින් දෙනලද තොරතුරු සටහන් කරගන්නා අතරම, තෝරාගැනීම සඳහා කෙරෙන වර්ගීකරණය, රඳවා තබා ගැනීමේ කොන්දේසි සහ සිරකොට තබා ගැනීමේ අවශ්‍යතාව සහ නීත්‍යානුකූල භාවය පිළිබඳ නෛතික අධීක්ෂණය සම්බන්ධයෙන් පාරදෘශ්‍යභාවයක් නොමැති වීම පිළිබඳව කමිටුව සැලකිලිමත් වෙයි. දැනට පුනරුත්ථාපනයේ සිටින්නේ 19 දෙනකු පමණක් බවත්, 12,169 දෙනකු දැනටමත් පුනරුත්ථාපනය කර ඇති බවත් නිල මූලාශ්‍ර වල දැක්වෙන බව සටහන් කර ගන්නා අතරේම, පුනරුත්ථාපන වැඩ සටහන යටතේ වූ පුද්ගලයන් ට වධහිංසා පමුණුවන ලද බවට විශ්වසනීය මූලාශ්‍ර වලින් මෑතදී ලැබුණු චෝදනා මෙන්ම, OISL වාර්තාවෙන් විමර්ශනය කරන ලද කාල වකවානුවේ පුනරුත්ථාපන මධ්‍යස්ථාන වලදී සිදුකෙරුණු වධහිංසා පිළිබඳ චෝදනා ගැනද කමිටුව අවධානය යොමු කරයි.

**26. නිසි කාර්ය පටිපාටියක රක්ෂාවරණයෙන් තොරව පුද්ගලයන් මධ්‍යස්ථාන වල රඳවා තබා ගැනීමට ඉඩ සලසමින් ත්‍රස්ත විරෝධී රෙගුලාසි යටතේ පවත්වාගෙන යන්නාවූ වර්තමාන "පුනරුත්ථාපන" වැඩ පිළිවෙල රාජ්‍ය පාර්ශවය විසින් අහෝසි කළ යුතුය. ඒ අතරවාරයේ, පුනරුත්ථාපනය කිරීම් සඳහා ගෙන තිබෙන සියලු තීන්දු මහේස්ත්‍රාත්වරුන් ලවා වහාම පුනරීක්ෂණය කළ යුතුය. ඒ පහත දැක්වෙන දෑ සහතික කරගැනීම පිණිසය;**

**(i) නඩු පැවරීමට නියමිත රැඳවියන්ට එරෙහිව අභිචෝදනා නගා හැකි ඉක්මනින් නඩු විභාග කිරීම.**

**(ii) අභිචෝදනා නගන්නේ නැති හෝ නඩු පවරන්නේ නැති අය වහාම නිදහස් කිරීම.**

**"පුනරුත්ථාපනය" කරන ලද 12,169 ක් දෙනා සම්බන්ධයෙන් රාජ්‍ය පාර්ශවය වගකිව යුතු අතර ඔවුන් හිතුමතේ අත් අඩංගුවට නොගන්නා බවට වගබලා ගත යුතුය. පුනරුත්ථාපන මධ්‍යස්ථාන වලදී වධහිංසා හා ලිංගික ප්‍රචණ්ඩතා කළ බවට නැගෙන චෝදනා ස්වාධීන යාන්ත්‍රණයක් මගින් වහාම, අපක්ෂපාතීව සහ පලදායී ලෙස විභාග කරන ලෙස කමිටුව රාජ්‍ය පාර්ශවයෙන් උදක්ම ඉල්ලා සිටී.**

**මූලික නෛතික රැකවරණ**

27. සිය පෙර නිර්දේශ (CAT/C/LKA/CO/3-4, 7 ඡේදය) සිහි කැඳවන කමිටුව, අත් අඩංගුවට ගැනීම පිළිබඳව ලංගම ඥාතියාට දැනුම් දීමට ඇති අයිතිය වැනි නිසි කාර්ය පටිපාටියට අයත් රැඳවියාගේ අයිතීන් තවමත් ජාතික නීති පද්ධතියට ඇතුලත් කර නොතිබීම ගැන අවධානය යොමු කරයි. නීතිඥයකුට සිය සේවාදයකයා/ දයිකාව ඕනෑම අවස්ථාවක පොලිස් ස්ථානයකදී නියෝජනය කිරීමේ අයිතිය 2012 පොලිස් ආඥා මගින් පිළිගෙන තිබෙන බව සටහන් කරගන්නා කමිටුව, රැඳවුමේ මුල සිටම නීතිඥයකු මුණ ගැසීමේ අයිතිය වර්තමාන නීති පද්ධතිය හෝ ආඥා හෝ මගින් සහතික කර නොතිබීම ගැන කනස්සල්ල පල කරයි. මේ අනුසාරයෙන් ගත් කල,

අපරාධ විධිවිධාන සංග්‍රහයට යෝජිත 2016 සංශෝධන මගින් රැඳවියකුට නීතිඥයකු මුණ ගැසීමේ අයිතිය සලසා දී ඇත්තේ පොලිසිය විසින් ප්‍රකාශයක් සටහන් කර ගැනීමෙන් පසුව වීම ගැන අවධානයෙන් යුතුව සටහන් කරයි. මේ යෝජනාව රජය විසින් නැවත සලකා බලමින් සිටින බව සටහන් කර ගන්නා අතරම, රැඳවියන් පොලිස් ප්‍රශ්න කිරීමේදී වධබන්ධනයට ලක්වීමේ අනතුර එවැනි නීතියක් මගින් තුරන් නොකෙරෙන බව කමිටුව අවධාරණය කරයි. මහේස්ත්‍රාත් අධිකරණයක් ඉදිරියේ සිදුකෙරෙන විමර්ශන ක්‍රියාමාර්ගය අනවශ්‍ය ලෙස දිග්ගැසෙන්නක් වන හෙයින්, රඳවා තබා ගැනීමේ නීත්‍යානුකූල භාවය අභියෝගයට ලක් කිරීම සඳහා හබෙයාස් කෝපස් ඉල්ලුම් පත්‍ර ප්‍රමාණවත් පිළියමක් නොවන බවට ලැබෙන තොරතුරු කමිටුවේ අවධානයට යොමුවෙයි (2 වගන්තිය).

**28. සියලු රැඳවියන්ට සිය නිදහස අහිමි වීමේ මූලාරම්භයේ සිටම මූලික නෛතික රැකවරණ ලැබෙන බව නීතියෙන්ද, ප්‍රායෝගික වශයෙන්ද සහතික වනු පිණිස, කමිටුවේ පොදු සටහන් අංක 2 හි දක්වා ඇති පරිදි අපරාධ විධිවිධාන සංග්‍රහ කෙටුම්පතේ අවශ්‍ය ව්‍යවස්ථාමය සංශෝධන කිරීමට රාජ්‍ය පාර්ශවය වග බලා ගත යුතුය. විශේෂයෙන්ම අත් අඩංගුවට ගෙන රඳවා තබාගෙන සිටින පුද්ගලයාට පහත දැක්වෙන අයිතිවාසිකම් හිමිවීම සහතික කළ යුතුය:**

**(අ) නිල බලයෙන් පත්කොට සිටින නීතිඥවරයකු නිර්බාධිතව හමුවීම ඇතුළුව, විශේෂයෙන්ම පොලිස් ප්‍රශ්න කිරීම් සිදුවන අවස්ථාවලදී නොපමාව නීතිඥයකු හමුවීමේ අයිතිය;**

**(ආ) රඳවාගැනීම සඳහා හේතු සහ රඳවා සිටින ස්ථානය ඥතියකුට හෝ රැඳවියාට අභිමත අයකු වෙත දැනුම් දීමේ අයිතිය;**

**(ඇ) රැඳවුමේ කවර අවස්ථාවකදී වුව එහි නීති ගරුක භාවය හෝ අවශ්‍යතාවය රැඳවියා වහාම නිදහස් කිරීමට නියෝග කිරීමේ බලය සහිත මහේස්ත්‍රාත් වරයකු ඉදිරියේ අභියෝගයට ලක් කිරීමේත්, ඒ සම්බන්ධයෙන් කල් නොයවා තීරණයක් ගැනීමේත් අයිතිය; හබයාස් කෝපස් නඩු විභාග හැකිතාක් ඉක්මනින් විනිශ්චය කිරීම සහතික කරනු පිණිස දැරෙන උත්සාහය රාජ්‍ය පාර්ශවය විසින් වැඩි කළ යුතුය. නීතිය ක්‍රියාවේ යොදවන නිලධාරීන් නෛතික රැකවරණ ලබාදෙන බව රාජ්‍ය පාර්ශවය විසින් නිරන්තරයෙන් තහවුරු කළ යුතු අතර, 02/2013 අපරාධ චක්‍රලේඛය ක්‍රියාවේ යොදවා ඒ අනුව කටයුතු කිරීමට අසමත් වන නිලධාරීන්ට දඬුවම් පැමිණවිය යුතුය.**

**වෛද්‍ය පරීක්ෂණ**

29. අත් අඩංගුවට ගන්නා ලද පුද්ගලයන් මහේස්ත්‍රාත් වරයකු හමුවට පමුණුවා නිදහස් කිරීමට පෙර, ඔවුන් නිත්‍ය වශයෙන් නෛතික-වෛද්‍ය පරීක්ෂණ සඳහා ගෙන එනු ලබන බවට රාජ්‍ය පාර්ශවය විසින් සපයා ඇති වාර්තාවේ දැක්වෙන තොරතුරු සටහන් කරගන්නා අතරම, නොමනා සැලකිලි දක්වන ලද බවට නෛතික-වෛද්‍ය වාර්තා වලින් ලැබුණු සාක්ෂි පදනම් කොටගෙන ආරම්භ කර ඇති විමර්ශන ගණන සම්බන්ධයෙන් තොරතුරු නැති වීම ගැන කමිටුව කනගාටුව පල කරයි. නෛතික-

වෛද්‍ය වාර්තාවේ පිටපතක් පරීක්ෂණයට භාජනය කරන ලද පුද්ගලයාට ලබා ගත හැකි වන්නේ එය අධිකරණයට යවනු ලදුව ප්‍රසිද්ධ ලියවිල්ලක් බවට පත්වීමෙන් අනතුරුව වීම කමිටුවේ අවධානයට ලක් වෙයි. එය වෛද්‍ය තොරතුරු සම්බන්ධයෙන් රැකිය යුතු රහසිගත භාවය අනතුරේ හෙලනු ලබන අතර, වින්දිතයා පලිගැනීම් වලටද නිරාවරණය කරයි. බන්ධනාගාර ගතව සිටියදී නෛතික-වෛද්‍ය පරීක්ෂණ සඳහා කෙරෙන ඉල්ලීම් සම්බන්ධයෙන් ගත් කල, බන්ධනාගාර වෛද්‍යවරුන්ට බන්ධනාගාර පාලනාධිකාරියෙන් අවසර ගන්නට සිදුවීම කමිටුවේ සැලකිල්ලට යොමුවී තිබේ. මෙය බන්ධනාගාර වෛද්‍යවරුන්ගේ රාජකාරි සමග බැඳියාවේ ගැටුමක් ඇති කරන්නට ඉඩ තිබෙන අතර, සාක්ෂි වසන් කිරීම සඳහා බලපෑම් ඇතිවීමේ ඉඩක් ද පවතී (2 ඡේදය).

30. **පහත දෑ සහතික කරන ලෙස කමිටුව රාජ්‍ය පාර්ශවයෙන් ඉල්ලා සිටී:**

**(අ) නිදහස අහිමි කිරීම ඇරඹුනු අවස්ථාවේ සිට රැඳවියා විසින්ම තෝරාගන්නා වෛද්‍යවරුන්ද ඇතුළුව, ස්වාධීන වෛද්‍ය වරුන් විසින් වහාම වෛද්‍ය පරීක්ෂණයක් පැවැත්වීම. මෙම වෛද්‍යවරුන් වධහිංසා සහ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිලි හෝ දඬුවම් පලදායී ලෙස විමර්ශනය සහ ලේඛනගත කිරීම පිලිබඳ අත්පොත (ඉස්තාන්බුල් ගිවිසුම) පරිහරණය සම්බන්ධයෙන් පුහුණුවක් ලද අය විය යුතුය;**

**(ආ) ඉල්ලූ විටෙක නෛතික-වෛද්‍ය වාර්තාව සෘජුවම රැඳවියාට හෝ ඔහුගේ/ ඇයගේ නීතිඥයාට ලබා දිය යුතුය;**

**(ඇ) පොලිස් නිලධාරීන්ට හෝ බන්ධනාගාර කාර්ය මණ්ඩලයට හෝ නොපෙනෙන, නෑසෙන දුරකින් පරීක්ෂණ පැවැත්විය යුතුය;**

**(ඈ) වධහිංසා හෝ නොමනා සැලකිලි පිලිබඳ සලකුණු පලිගැනීමට ලක් වීමේ අවදනමකින් තොරව ස්වාධීන අධිකාරියකට රහසිගතව වාර්තා කිරීමේ හැකියාව වෛද්‍යවරුන් සතුව තිබිය යුතුය.**

**බලහත්කාරයෙන් ලබාගන්නා පාපොච්චාරණ**

31. සහකාර පොලිස් අධිකාරී හෝ ඊට ඉහල නිලධාරියකු විසින් ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ ලබාගන්නා පාපොච්චාරණ නීතිඥයකු නොසිටියදී ලබාගත්තද, බලහත්කාරය නිසා දෙන ලද්දක් වීමේ හේතුවෙන් චූදිතයා විසින් ප්‍රතික්ෂේප කරන ලද්දේ වුවද, එයම එකම සාක්ෂිය ලෙස අධිකරණය විසින් පිළිගනු ලැබීම ගැන කමිටුව දිගටම සැලකිලිමත් වෙයි. මීට ඉහත කමිටුව විසින් ඒ සම්බන්ධයෙන් කරන ලද නිර්දේශද මෙහිදී සිහිපත් කරදෙනු ලැබේ. ඊනියා මූලික විමර්ශනය (*voire dire*) හෙවත් සාක්ෂි පිළිගැනීමට ඇති හැකියාව පිළිබඳ පරීක්ෂණයෙන් අනතුරුවද, ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත යටතේ රඳවාගෙන සිටින්නන්ගේ සාක්ෂි භාර ගන්නේද නැද්ද යන්න පිළිබඳ අවසාන අභිමතය

විනිසුරුවරයා විසින් භුක්ති විඳිනු ලැබීමත්, පීඩාකාරී තත්වයක් යටතේ පාපොච්චාරණය කළ බව ඔප්පු කිරීමේ වගකීම රැඳවියන් ට පැවරී තිබීමත් කමිටුවේ අවධානයට ලක්වී තිබේ. ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත වෙනුවට ගෙන ඒමට යෝජනා කරන නව කෙටුම්පතේද එම නීතියම අනුගමනය කරන්නට යාම පිළිබඳව ලැබී ඇති තොරතුරු කමිටුව බිය ගන්වයි. සියයට අනූවක්ම වරදකරුවන් බවට පත් කරනු ලබන්නේ පාපොච්චාරණයක් පමණක් හෝ එය ප්‍රධාන සාක්ෂිය ලෙස සැලකීමෙන් පමණක් හෝ බවට ලැබෙන තොරතුරු ගැන කමිටුවේ බරපතල අවධානය යොමුවී තිබේ. වධහිංසා සම්බන්ධයෙන් ලේඛනගත වී තිබෙන බොහෝ සිද්ධි වලට අදාළව, සැකකරුවා චෝදනා කොට ඇත්තේ, තමන්ටම වරද පවරාගන්නා, නැතිනම් නොතේරෙන භාෂාවකින් ලියැවුනු ප්‍රකාශනයකට හෝ හිස් කඩදසියකට හෝ බලහත්කාරයෙන් අත්සන් ලබාගත් බවය (2, 12 සහ 15 වගන්ති).

**32. බලහත්කාරයෙන් ලබාගත් පාපොච්චාරණ රාජ්‍ය ආරක්ෂාව ද ඇතුළු නඩු විභාග සම්බන්ධ සාක්ෂි වශයෙන් අධිකරණයේදී පිළිගත නොහැකි බව ජාතික නීති පද්ධතිය හෝ දැනට පවත්නා ආරක්ෂක නීති රාමුව වෙනුවට ගෙන එනු ලබන වෙනත් ව්‍යවස්ථා යෝජනා හෝ මගින් දැඩිසේ සහතික කිරීම සඳහා අවශ්‍යවන ව්‍යවස්ථාමය සංශෝධන රාජ්‍ය පාර්ශවය විසින් සිදු කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කටයුතු කරන ලෙස කමිටුව රාජ්‍ය පාර්ශවයෙන් ඉල්ලා සිටී:**

**(අ) ප්‍රකාශයක් කරන ලද්දේ වධහිංසා පැමිණවීම යටතේ බවට චෝදනාවක් එල්ල වන අවස්ථාවකදී, ඔප්පු කිරීමේ වගකීම කිසිදු ව්‍යතිරේඛයකින් තොරව අභිචෝදක බලධාරීන් වෙත පැවරෙන බව සහතික කළ යුතුය. වෝහාරික වෛද්‍ය පරීක්ෂණයක් සිදු කිරීමට වහාම නියෝග කොට සියලු චෝදනා කඩිනමින්ද, විධිමත්වද විමර්ශනය කෙරෙන බව සහතික කිරීම;**

**(ආ) ත්‍රස්තවාදයට අදාළ වැරදිද ඇතුළුව, සියලු අපරාධ නඩු විභාග වලදී ශ්‍රී ලංකාවේ සාක්ෂි ආඥාපනත බලාත්මක කළ යුතුය. බලහත්කාරයෙන් ලබා ගන්නා ලද එකක් වීමේ හේතුවෙන් වගඋත්තර කරුවන් විසින් මහේස්ත්‍රාත්වරුන් හමුවේ බැහැර කරනු ලබන නඩු ඇසීමෙන් තොරව ගන්නා ලද පාපොච්චාරණ, විශේෂයෙන්ම වෛද්‍ය පරීක්ෂණය විසින් ඔවුන්ගේ ප්‍රකාශය තහවුරු කෙරෙන අවස්ථාවලදී, නඩු විභාගයෙන් ඉවත් කිරීම;**

**(ඇ) නිදහස අහිමි කරනු ලැබූ පළමු අවස්ථාවේ සිට සියලු නඩු කටයුතු සඳහා පරිවර්තකයකු ලබා ගැනීමට චූදිතයාට ඇති අයිතිය ජාතික ව්‍යවස්ථාව තුල අන්තර්ගත කිරීම;**

**(ඈ) වධහිංසා යටතේ ලබාගත් පාපොච්චාරණ පදනම් කරගෙන පවත්වන ලද නඩු විභාග නැවත විභාග කිරීමට ඉඩ සැලසෙන පියවර සම්මත කර ගැනීම.**

## ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිෂන් සභාව

33. 19 වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් (ඉහත 5 (ඇ) ඡේදය බලන්න) අනතුරුව 2015 ඔක්තෝබරයේ අලුතින් කොමසාරිස්වරුන් පත් කිරීම අගය කරන අතර, රැඳවියන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කෙරෙන බවට පැමිණිලි ලද වහාම පොලිස් ස්ථාන වලට හෝ බන්ධනාගාර වෙත යාමට විවිධ පරිපාලන සහ කාර්ය සම්පාදන ගැටළු හේතු සාධක නිසා කොමිසමට නොහැකිවීම කමිටුවේ අවධානයට යොමු වෙයි. කොමිසම විසින් ක්‍රියාත්මක කොට ඇති රහසිගතව පැමිණිලි කිරීමේ යාන්ත්‍රනය අගය කරන අතර, ඉහත දක්වා ඇති ආකාරයෙන් ඒ පැමිණිලි අනුව නිත්‍ය වශයෙන් අපරාධ පරීක්ෂණයක් සිදු නොවීම කමිටුවේ කනස්සල්ලට හේතු වෙයි. එමෙන්ම, විශේෂයෙන් ප්‍රඥප්තියට අවනත වීම හේතුවෙන් බිහිවී තිබෙන අලුත් නීති වලට අනුකූලව කටයුතු කරන ලෙස කොමිසම කරන නිර්දේශ ක්‍රියාවේ යෙදවීම හැමවිටම රාජ්‍ය පාර්ශවය අතින් සිදු නොවීම කොමිසමේ කණස්සල්ලට හේතුවෙයි (2 වගන්තිය).

**34. කැපවීමෙන් යුත් ව්‍යුහයකින් සමන්විතව, මනාව පුහුණුව ලද කාර්ය මණ්ඩලයකින් යුතුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසමට තම පුළුල් වරම පලදයී ලෙස ක්‍රියාවේ යෙදවීම පහසු කරවනු සඳහා රාජ්‍ය පාර්ශවය ඊට සප්‍රමාණවත් සම්පත් සම්පාදනය කළ යුතුය. සියලු අත් අඩංගුවට ගැනීම් සහ මාරුකර යැවීම් මෙන්ම, රඳවා ගැනීමේදී සිදුවන කිසියම්ම හෝ කෙලෙසීමක් වේ නම්, ඒ ගැන කොමිසමට වහාම දැනුම් දීමේ නෛතික බැඳීම රාජ්‍ය පාර්ශවය විසින් අනුගමනය කළ යුතුය. කොමිසමේ නිර්දේශ සහ අපරාධ විමර්ශන සඳහා යොමු කොට ඇති වධහිංසා කිරීම් පිළිබඳ ලේඛනගත කොට ඇති පැමිණිලි සම්බන්ධයෙන් රාජ්‍ය පාර්ශවය වහාම පියවර ගත යුතුය. OISL වාර්තාවෙන් නිර්දේශ කොට ඇති පරිදි, කොමිසමට ලැබෙන පැමිණිලි කෙලින්ම අධිකරණයට යොමු කළ හැකිවන සේ කොමිසමේ බලය වැඩි වන ආකාරයෙන් නීති සම්පාදනය කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය පාර්ශවයේ සැලකිල්ල යොමු විය යුතුය.**

## රඳවා ගැනීමේ කොන්දේසි

35. වධහිංසාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිතයා ශ්‍රී ලංකාවේ කළ සංචාරයෙන් පසු ඔහුගේ මූලික නිරීක්ෂණ වල තක්සේරුව අනුව, බන්ධනාගාර සහ රැඳවුම් මධ්‍යස්ථාන වල, විශේෂයෙන්ම, ත්‍රස්ත විමර්ශන ඒකකයේ, පවතින්නේ කුරිරු, අමානුෂික සහ අවමාන සහගත තත්වයක් බව දක්වා තිබීම කමිටුව තැති ගන්වයි. ඔහුට අනුව, ඇතැම් තැන්වල, විශේෂයෙන් වවුනියාව රිමාන්ඩ් බන්ධනාගාරයේ, සෙනග වැඩිවීම සියයට 200 ඉක්මවන අතර, යටිතල පහසුකම් ඌනතාව, දුර්වල සනීපාරක්ෂක පහසුකම්, ආලෝකය සහ වාතාශ්‍රය මඳකම මෙන්ම සෞඛ්‍ය, ක්‍රීඩා සහ අධ්‍යාපන පහසුකම් සඳහා ප්‍රමාණවත් අවස්ථා නොමැතිකමද පවතී. සිරගෙවල් බැලීමට යන කමිටු තුනක් ඇති බව නව බන්ධනාගාර පරිපාලන පනතේ පෙරදක්වා ඇති බව සටහන් කරගන්නා අතරේම, එම ආයතන වල ස්වාධීනත්වය තහවුරු කෙරෙන යාන්ත්‍රණ සම්බන්ධයෙන් තොරතුරු නැතිවීම පිළිබඳව කමිටුව කනගාටු වෙයි. රැඳවුම් මධ්‍යස්ථාන වෙත නොදන්වා යාමට මානව හිමිකම් කොමිසම සතු වරම පිළිබඳ සැලකිලිමත් වන අතරම කොමිසමට එවැනි පුළුල් වරමක් පලදයී

ලෙස ක්‍රියාවේ යෙදවීමට ඇති හැකියාව ගැන කමිටුවේ අවධානය යොමුවෙයි (2,11 සහ 16 වගන්ති).

36. **රාජ්‍ය පාර්ශවය පහත කාරනා ඉටු කළ යුතුය:**

**(අ) පළමු වරද කළවුන්ට හෝ ඇතැම් සුළු අපරාධ කරුවන්ට හෝ අත්හිටවූ සිර දඬුවම් පැනවීම වැනි බන්ධනාගාර ගතකිරීමට විකල්ප ක්‍රියාමාර්ග මගින් සිරගෙවල සෙනග වැඩිවීම සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු කිරීම;**

**(ආ) බන්ධනාගාර පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ගන්නා උත්සාහය දිගටම පවත්වාගෙන යමින්, වැලිකඩ බන්ධනාගාරය වැනි ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූල නොවන ස්ථාන නැවත සකස් කොට, රැඳවුමේ තත්වය දියුණු කර නැවත සමාජගත කිරීමේ සහ පුනරුත්ථාපනයේ ක්‍රියාවලි ශක්තිමත් කිරීම;**

**(ඇ) බන්ධනාගාරයේ සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කොට හදිසි අවස්ථාවකදී හෝ බරපතල රෝගී තත්වයකදී ජාතික රෝහලට වහාම මාරුකර යවන බවට වගබලා ගැනීම;**

**(ඈ) සියලුම රැඳවුම් ස්ථාන නිරන්තරයෙන් අධීක්ෂණය කිරීම සඳහා ස්වාධීන යාන්ත්‍රණයක් ස්ථාපිත කරගැනීමේ අරමුණින් යුතුව සම්මුතියේ අමතර කෙටුම්පත නීතිගත කිරීම ගැන සලකා බැලීම.**

**අත් අඩංගුවේ මරණ**

37. සැක කටයුතු තත්වයන් යටතේ පොලිස් අත් අඩංගුවේ සිදුවූ අධිකරණ බලධාරීන් විසින් පහදා දී නැති මරණ කිහිපයක්ම ගැන කමිටුවේ අවධානය යොමුවී පවතී. චන්ද්‍රසිරි දසනායක, පී එච් සඳුන් මාලිංග සහ කඹුරුපිටියේ පොලිස් නිලධාරියකු සහ ඔහුගේ බිරිඳගේ ඝාතන සම්බන්ධයෙන් අත් අඩංගුවට ගන්නා ලද හතර දෙනකුගේ මරණ ඒ අතර වෙයි. අත් අඩංගුවේ මරණ ගැන පරීක්ෂණ කිරීමේ විධික්‍රමය ශක්තිමත් කිරීම සඳහා කෙරෙන සාකච්ඡා සටහන් කරගන්නා අතරම, මියයන විට ඒ පුද්ගලයා අත් අඩංගුවේ සිටි පොලිසිය විසින්ම දැනට පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධ කමිටුවේ අවධානය එලෙසම පවතී (2, 11, 12 සහ 16 වගන්ති).

**38. පහත දැක්වෙන දෑ සහතික කිරීම සඳහා අවශ්‍ය පියවර රාජ්‍ය පාර්ශවය විසින් ගනු ලැබිය යුතුය:**

**(අ) චන්ද්‍රසිරි දසනායක, පී එච් සඳුන් මාලිංග සහ කඹුරුපිටියේ පොලිස් නිලධාරියකු සහ ඔහුගේ බිරිඳගේ ඝාතන සම්බන්ධයෙන් අත් අඩංගුවට ගන්නා ලද හතර දෙනාගේ මරණ ඇතුළු අත් අඩංගුවේ මරණ සියල්ලක් පිළිබඳව, අත් අඩංගුවේ තබාගෙන සිටි ආයතනය සමග කිසිදු ආයතනික හෝ ධූරාවලි සම්බන්ධයක් නොමැති ස්වාධීන විමර්ශන ඒකකයක් විසින් අපක්ෂපාතී විභාගයක් පැවැත්වීම;**

**(ආ) පශ්චාත් මරණ පරීක්ෂණ වලදී කුමන්ත්‍රණ සිදුවීම වැලැක්වීම සඳහා ඒවා මරණය සිදුවූ ප්‍රදේශයෙන් පිටත පැවැත්වීම;**

**(ඇ) අත් අඩංගුවේ මරණ සම්බන්ධයෙන් වගකිව යුත්තන් යුක්තිය හමුවට පමුණුවා සප්‍රමාණවත් ලෙස දඬුවම් කිරීම.**

**මානව හිමිකම් රකින්නන් සහ මාධ්‍යවේදීන්ට අඩන්තේට්ටම් කිරීම**

39. වධබන්ධන සහ අතුරුදහන්වීම් පිළිබඳ ප්‍රකාශන වාර්තා වීමට බාධා පමුණුවමින් මානව හිමිකම් ආරක්ෂකයන් සහ මාධ්‍යවේදීන් ට අඩන්තේට්ටම් කිරීම සහ ඔවුන් හිතුමතේ රඳවා තබා ගැනීම ගැන නිරන්තරයෙන් ලැබෙන වාර්තා පිළිබඳව කමිටුව දිගටම අවධානයෙන් පසුවෙයි. මාධ්‍යවේදී ප්‍රගීත් එක්නැලිගොඩ ගේ අතුරුදහන් වීම වැනි කමිටුව විසින් මතුකොට තිබෙන අතීත උල්ලංඝන සම්බන්ධ විමර්ශන වල ප්‍රගතියේ මන්දගාමී බව ගැන කමිටුව කනගාටුව පල කරයි. කමිටුව 2011 දී කලින් වාර්තාව සමාලෝචනය කරන විට ශ්‍රී ලංකා කණ්ඩායමේ නායකයා වූ හිටපු නීතිපති වරයා විසින් විදේශගත වූ බව සඳහන් කෙරුනු ප්‍රගීත් එක්නැලිගොඩ සම්බන්ධ පුළුල් ජාතික විමර්ශනයකින් අනතුරුව ජාතික අධිකරණයකින් ප්‍රකාශයට පත් කෙරුනේ ජාතික සන්නද්ධ හමුදවේ සාමාජිකයන් විසින් ඔහු පැහැරගෙන යන ලද බවයි. ඒ සම්බන්ධයෙන් රඳවා තබාගෙන සිටි හමුද නිලධාරීන් 13 දෙනාගෙන් 9 දෙනකු වින්දිතයාගේ පවුල විසින් පල කොට ඇති බිය නොතකාම ඇප මත නිදහස් කර යැවීම සම්බන්ධ වාර්තා ගැනද කමිටුව සැලකිලිමත් වෙයි. මෑතදී සිදුවූ රුකී ප්‍රනාන්දු හිතුමතේ රඳවා තබා ගැනීම පිළිබඳ චෝදනාව, මයුරි ඉනෝකාගෙන් පලිගැනීමක් වශයෙන් කෙරෙන පොලිස් පරීක්ෂණ පිළිබඳ වාර්තාව හෝ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරී කමිටුව 2015 ශ්‍රී ලංකාවට ගිය අවස්ථාවේ ඒ සමග කටයුතු කළ හෝ කටයුතු කළ බවට සැක කෙරෙන පුද්ගලයන් බිය වැද්දීම පිළිබඳ චෝදනා සම්බන්ධයෙන් කෙරෙන පරීක්ෂණ සම්බන්ධයෙන් තොරතුරු නැති වීම ගැන කමිටුව කනගාටුව පල කරයි (16 වගන්තිය).

**40. පහත දැක්වෙන කරුණු ඉෂ්ඨ කරන ලෙස කමිටුව රාජ්‍ය පාර්ශවයෙන් ඉල්ලා සිටී**

**(අ) මානව හිමිකම් ආරක්ෂකයන්ට සහ මාධ්‍යවේදීන්ට එරෙහි ප්‍රහාර ප්‍රසිද්ධියේ හෙළාදැක ඔවුන්ට නිසි ආරක්ෂාව ලබා දීමට පියවර ගත යුතුය.**

**(ආ) කමිටුව විසින් ලැයිස්තුගත කර තිබෙන කාරණාද (CAT/C/LKA/Q/5) ඇතුළුව කමිටුවේ අවධානය යොමුවී ඇති සිද්ධි වහාම විභාග කළ යුතුය. වගකිවයුත්තන්ට එරෙහිව නිසි පියවර ගන්නා බවටත්, පීඩිතයන්ට වන්දි ගෙවන බවටත් රාජ්‍ය පාර්ශවය සහතික විය යුතුය.**

**(ඇ) ප්‍රගීත් එක්නැලිගොඩ මහතා පැහැරගෙන යාම ගැන චෝදනා ලබන අපරාධ කරුවන් ට එරෙහිව ගනු ලබන නීති කෘත්‍යයේ වර්ධනයන් සහ එහි ප්‍රතිපලය සම්බන්ධයෙන් කමිටුව වහාම දැනුවත් කොට, සියලු ආකාර**

**අඩන්තේට්ටම් සහ පලිගැනීමෙන් ආරක්ෂා වීමට අවශ්‍ය පලදායි රැකවරණය එක්නැලිගොඩ මහතාගේ පවුලේ සාමාජිකයන්ට සලසා දිය යුතුය.**

**(ඈ) මානව හිමිකම් හා අදාළ කාරනා නිදහසේ වාර්තා කිරීම වලක්වාලනු පිණිස මාධ්‍යවේදීන් සහ මානව හිමිකම් ආරක්ෂකයන් බියගැන්වීමේ ක්‍රමයක් ලෙස ඔවුන් රඳවා තබා ගැනීමේ සහ නඩු පැවරීමේ පුරුද්ද අත් හල යුතුය.**

**ශ්‍රී ලාංකික සාමසාධක භටයන් බාල දරුවන්ට ලිංගික අපචාර කිරීම**

41. එක්සත් ජාතීන්ගේ හයිටියේ ස්ථාවරකරන මෙහෙයුමේ (MINUSTAH) යොදවා සිටි ශ්‍රී ලංකා හමුදා බල ඇණි විසින් බාලයන් ලිංගික සූරාකෑමට සහ අපහරණයට ගොදුරු කර ගැනීම පිලිබඳ චෝදනා වලට අදාළ කලින් නිර්දේශ සිහි කැඳවන කමිටුව, සියයකට අධික චූදිතයන් අතරින් 23ක් පමණක් වරදකරුවන් වීම සම්බන්ධයෙන් තවමත් සැලකිලිමත් වෙයි. හමුදා පරීක්ෂණ මණ්ඩලයක් විසින් නිසි පටිපාටිය අනුගමනය කොට විනය පරීක්ෂණයක් පවත්වා දඬුවම් දුන් බවට රාජ්‍ය පාර්ශවය පවසන දේ සටහන් කරගන්නා අතරම, මේ බරපතල අපරාධ වෙනුවෙන් දෙන ලද දඬුවම් හෝ දඩ පැනවීම් කවරාකාරදැයි රාජ්‍ය පාර්ශවය විසින් පැහැදිලි නොකිරීම ගැන කනගාටුව පල කරයි. සාම සාධක මෙහෙයුම් සඳහා නිලධාරීන් තෝරා ගැනීමේදී දැඩි පූර්ව සෝදිසි විධික්‍රමයක් අනුගමනය කරන බවට සඳහන් තොරතුරු සටහන් කර ගන්නා කමිටුව, හයිටියේ බාල අපචාර සම්බන්ධයෙන් චෝදනා ලබා සිටින කිසියම් සොල්දාදුවකු මාලි රාජ්‍යයේ ඉදිරි සාම සාධක මෙහෙයුම් වලට පැහැදිලි කර නැති වීම ගැන කනගාටු වෙයි.

**42. එක්සත් ජාතීන්ගේ කාර්යාලයේ අභ්‍යන්තර ප්‍රමාද ද්වේෂ සේවයේ වාර්තාවද ඇතුළුව, MINUSTAH මෙහෙයුමේ යොදවා සිටි හමුදා කාර්ය මණ්ඩලයේ බාල අපචාර සම්බන්ධයෙන් කරන ලද විමර්ශනයේ ද, කිසියම් අධිචෝදනා නැගීමක්, නඩු පැවරීමක් වී නම් ඒ සංඛ්‍යාවද, පනවන ලද යම් දඬයක් වේ නම් ඒ ගැනද තොරතුරු ලබා දෙන ලෙස කමිටුව රාජ්‍ය පාර්ශවයෙන් ඉල්ලා සිටී. එවන් ක්‍රියා සඳහා වග කිව යුත්තන්ට ඔවුන්ගේ වරදේ බරපතල කම අනුව දඬුවම් පමුණුවා පීඩිතයන් ට යුක්ති සහගත සහ ප්‍රමාණවත් වන්දි ලබා දී හැකි පමණින් අංග සම්පූර්ණ පුනරුත්ථාපනයක් ලබා දීමට රාජ්‍ය පාර්ශවය වග බලා ගත යුතුය. ලිංගික අපචාර වලක්වාලීම සඳහා වන නිශ්චිත පුහුණුව ලබා දී, මේ ආකාර අපහරණ ඉදිරි සාමසාධක මෙහෙයුම් වලදී සිදු නොවනු පිණිස රාජ්‍ය පාර්ශවය සප්‍රමාණවත් පියවර ගත යුතුය. මේ සඳහා, හයිටියේ ළමා අපචාර මෙන්ම ශ්‍රී ලංකාවේ වෙනත් මානව හිමිකම් උල්ලංඝන සිදු කර ඇති අණ දෙන නිලධාරීන්ද ඇතුළු ඕනෑම පුද්ගලයකු එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් වලට නොයවන පිණිස රාජ්‍ය පාර්ශවය විසින් පූර්ව සෝදිසිය වෙනුවෙන් පලදායී පියවර ගත යුතුය.**

**පෙරලා පිටුවහල් නොකිරීම**

43. සිය පූර්ව නිර්දේශ (CAT/C/LKACO/3-4, 27 ඡේදය) සිහිපත් කරන කමිටුව සම්මුතියේ 3 වැනි වගන්තියේ අන්තර්ගතවී තිබෙන පෙරලා පිටුවහල් නොකිරීමේ

මූලධර්මය සහතික කිරීම සඳහා රක්ෂාවරණය පිළිබඳ ජාතික නෛතික හා ප්‍රතිපත්ති රාමුවක් සකස් කර නොගැනීම සම්බන්ධයෙන් දිගටම සැලකිල්ල යොමු කරයි. එමනිසා සරණාගතයන් අවිධිමත් සංක්‍රමණිකයන් සේ සලකා බොහෝවිට අත්අඩංගුවට ගෙන පිටුවහල් කරනු ලැබීම කමිටුව අවධානයෙන් යුතුව සටහන් කරයි (3 වගන්තිය).

**44. රාජ්‍ය පාර්ශවය පහත දැක්වෙන කටයුතු කළ යුතුය:**

**(අ) සම්මුතියේ 3 වගන්තියේ දැක්වෙන පෙරලා පිටුවහල් නොකිරීමේ මූලධර්මය සම්පූර්ණයෙන්ම දේශීය නීති පද්ධතියට ඇතුල් කර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය පියවර ගැනීම;**

**(ආ) අයැදුම්කරු පෙරලා යවනු ලබන රටේදී වධබන්ධනයට ගොදුරු වීමේ බරපතල අවදනමක් ඇතිද, නැතිද යන්න පූර්ණ වශයෙන් තීරණය කිරීම සඳහා ජාතික සරණාගත තීරක පටිපාටියක් වහාම ස්ථාපිත කරමින් අයැදුම්කරුවන් වධහිංසාවට ලක්ව සිටීමේ හෝ ක්ෂතිය පිළිබඳ ලක්ෂණ දකින්නට ලැබේ නම් වෛද්‍ය හා මනෝවෛද්‍ය පරීක්ෂණයකට ලක් කිරීම;**

**(ඇ) ජාත්‍යන්තර ආරක්ෂාව ලබා දිය යුතු පුද්ගලයන් රඳවා තබා නොගැනීම හෝ, වෙනත් විකල්ප ඇතිදැයි හොඳින් සොයා බලා ඒ නැතිනම්, දඬුවම් සඳහා සිරගත කරන තැන් නොවන, මේ සඳහාම පිහිටුවන ලද මධ්‍යස්ථාන වල හැකිතාක් කෙටිම කාලයකට රඳවා තැබීම;**

**(ඈ) සරණාගතයන්ගේ තත්වයට අදළ 1951 සම්මුතිය සහ එහි 1967 කෙටුම්පත අනුමත කිරීම ගැන සලකා බැලීම.**

**වධහිංසාවෙන් පීඩාවට පත්වූවන්ට පිළියම්**

45. වධහිංසාවෙන් පීඩාවට පත්වූවන් වෙනුවෙන් 2011 සිට ගෙවන ලද ප්‍රමාණවත් නොවන වන්දි ගැන අවධානය යොමු කරන කමිටුව, ගෙවන ලද මුළු මුදල හා දෙන ලද පුද්ගලයන් සංඛ්‍යාව පිළිබඳව තොරතුරු නොමැති වීම ගැන කනගාටුව පල කරයි. ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ නොවිසඳී තිබෙන අති විශාල නඩු ප්‍රමාණය ගැනත්, අභියාචනා ඉදිරිපත් කළ නොහැකි මේ වන්දිය ආර්ථික බාධක නිසා සියලු වින්දිතයන්ට ලබාගැනීමට නොහැකි වීම ගැනත් කමිටුව අවධානයෙන් යුතුව සටහන් කරයි. ඊට අමතරව, වධහිංසාවෙන් පීඩාවට පත් අයට වාසිදයක ලෙස අධිකරණය ලබා දෙන තීන්දු මගින් පලදයී විමර්ශන හෝ නඩු පැවරීම් සිදු කෙරෙන බවක් සහතික නොකෙරේ. වන්දි ඉල්ලා දිස්ත්‍රික් අධිකරණ වල පවරන ලද නඩු ප්‍රමාණය හෝ වධහිංසාවෙන් පීඩාවට පත් වුවන් හට දෙන ලද මුදල් ප්‍රමාණය හෝ පිළිබඳ තොරතුරු නැතිවීම කමිටුවේ කනගාටුවට හේතු වෙයි. වධහිංසාවෙන් පීඩාවට පත් වූවන් සඳහා පුනරුත්ථාපන වැඩ සටහන් නොමැති වීම ගැනද කමිටුව කනස්සල්ල පල කරයි.

**46. සිය පොදු සටහන් අංක 3 (2013) සිහි කැඳවන කමිටුව පහත සඳහන් කරුණු ඉටු කරන ලෙස රාජ්‍ය පාර්ශවයෙන් ඉල්ලා සිටී.**

**(අ) වධහිංසාවට සහ නොමනා සැලකිල්ලට ගොදුරු වූවන් හට ප්‍රතිසංස්ථාපනය, ප්‍රමාණවත් වන්දි, පුනරුත්ථාපනය, සන්තර්පණය සහ පුනරාවර්තනය නොවන බව සහතික කිරීම ඇතුළු සියලු ආකාරයේ පලදායී පිළියම් වලින් ප්‍රතිලාභ අත්වන බව සහතික වන පරිදි අවශ්‍ය සියලුම නීතිමය සහ පරිපාලනමය පියවර ගැනීම;**

**(ආ) වදහිංසාවෙන් පීඩාවට පත් වූවන්ගේ අවශ්‍යතා පූර්ණ වශයෙන් තක්සේරු කර,  රාජ්‍යයේ පුනරුත්ථාපන සේවා සෘජුව මැදිහත් වීමෙන් හෝ රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු වෙනත් ආයතන වල මුල්‍යාධාර යෙදවීමෙන් හෝ විශේෂිත, සාකල්‍ය පුනරුත්ථාපන සේවා සපයාදීම සහ ඒවා කිසිදු වෙනස්කම් පෑමකින් තොරව වහාම ලබාගැනීමේ පහසුකම සැලසීමට වගබලා ගැනීම.**

**පුහුණුව**

47. සම්මුතියේ අඩංගු නියමයන් හමුද හා පොලිස් පුහුණු වැඩසටහන වලදී උගැන්වීම අගය කරන අතරම, බලහත්කාරී නොවන විමර්ශන විධික්‍රම සහ විමර්ශන සඳහා යොදගන්නා දියුණු ක්‍රම පිළිබඳ පුහුණුව ලබා දෙන්නේ ඒ ඒ අවස්ථාවල පමණක් වීම ගැන කමිටුව කනගාටුව පල කරයි. වෝහාරික වෛද්‍ය විමර්ශන සහ වධහිංසාවත්, නොමනා සැලකීමත් පිළිබඳව ලේඛනගත කිරීම සම්බන්ධයෙන් විශේෂිත පුහුණු ලබා දියයුතු බව දක්වමින් වධහිංසාව පිළිබඳ විශේෂ නියෝජිතයා කර ඇති ඇගැයීම ගැනද කමිටුව අවධානය යොමුකරයි.

**48. සම්මුතියේ නියමයන් සහ ඉස්තාන්බුල් ගිවිසුම පිළිබඳව සියලුම රාජ්‍ය නිලධාරීන්ටත්, නිදහස අහිමි කරනු ලැබූ පුද්ගලයන්ට සැලකීම සහ භාරයේ තබා ගැනීමට සම්බන්ධ සියලුම නිළධාරීන්ට බලහත්කාරී නොවන ප්‍රශ්න කිරීමේ ක්‍රම ගැනත්, කලින් කලට අනිවාර්ය පුහුණුවක් රාජ්‍ය පාර්ශවය විසින් ලබා දිය යුතුය. එමෙන්ම, සම්මුතියට සහ ඉස්තාන්බුල් ගිවිසුමට අදළ අධ්‍යාපනික සහ පුහුණු වැඩසටහන් වල පලදායී බව තක්සේරු කිරීම සඳහා ක්‍රමවේදයක් වැඩි දියුණු කොට එය ක්‍රියාවේ යෙදවීම රාජ්‍ය පාර්ශවය විසින් සිදු කළ යුතුයි.**

**පසු විපරම් කාර්යාවලිය**

49. කමිටුවේ සමාප්ති නිරීක්ෂණ වල 14 (ආ), 16 සහ 18 ඡේද වලට අදළ පසු විපරම පිළිබඳව තොරතුරු 2017 දෙසැම්බර් 7 වැනිදු වන විට ලබා දෙන ලෙස රාජ්‍ය පාර්ශවයෙන් ඉල්ලා සිටී. මේවා සම්බන්ධයෙනි: 2008 මාර්තු සිට 2009 ජූනි දක්වා මෙන්ඩිස් මහතා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පොලිස්පති වශයෙන් රාජකාරියේ යෙදී සිටියදී සිදුවූ බවට චෝදනා නැගෙන වධහිංසා සම්බන්ධයෙන් ඔහුගේ කාර්යභාරය සහ වගකීම්; වධබන්ධන, බලහත්කාර අතුරුදහන් කිරීම් සහ වෙනත් බරපතල මානව හිමිකම් උල්ලංඝන විමර්ශනය කිරීමට විශේෂ නීතිඥයන්ගෙන් සමන්විත අධිකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම; වධහිංසාවට

ගොදුරු වූ පීඩිතයන් සඳහා ස්වාධීන, ප්‍රතිපල දයක, රහස්‍යභාවය ආරක්ෂා කරන සහ පහසුවෙන් ප්‍රවේශ විය හැකි පැමිණිලි කිරීමේ යාන්ත්‍රණයක් පිහිටුවා අපරාධවල පීඩිතයන් සහ සාක්ෂිකරුවන් සඳහා ආධාර සහ ආරක්ෂාව සඳහා වන පනත සංශෝධනය කළ යුතුය. ඒ සන්දර්භය තුල, සමාප්ති නිරීක්ෂණ වල ඇතැම් හෝ සියලු නිර්දේශ, ඉදිරි වාරිකය තුලදී ක්‍රියාවේ යෙදවීම සඳහා වන සැලසුම කමිටුවට දැනුම් දෙන ලෙස රාජ්‍ය පාර්ශවයෙන් ඉල්ලා සිටිනු ලැබේ.

50. තවමත් අත්සන් තබා නැති එක්සත් ජාතීන්ගේ මූලික මානව හිමිකම් සම්මුති අනුමත කරන ලෙස කමිටුව රාජ්‍ය පාර්ශවයට ආරාධනය කරයි.

51. කමිටුවට ලබා දුන් වාර්තාවත්, මේ සමාප්ති නිරීක්ෂණත්, සිංහල සහ දෙමළ ඇතුළු නිසි භාෂා වලින්, නිල වෙබ් අඩවි ඔස්සේද, ජනමාධ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධාන මගින්ද පුළුල් ලෙස ප්‍රචලිත කරන ලෙස රාජ්‍ය පාර්ශවයෙන් ඉල්ලා සිටිනු ලැබේ.

52. සිය හයවැනි වාරික වාර්තාව 2020 දෙසැම්බර් 7 වනවිට ඉදිරිපත් කරන ලෙස කමිටුව රාජ්‍ය පාර්ශවයට ආරාධනය කරයි. මේ අරමුණ ඉටු කරගැනීම පිණිස දෙසැම්බර් 7 වනවිට වාර්තාකිරීමේ වෛකල්පික ක්‍රමවේදය යටතේ තම වාර්තාව සකස් කිරීමට එකඟ වන ලෙස කමිටුව රාජ්‍ය පාර්ශවයට ආරාධනය කරයි. එහිදී කමිටුව වාර්තා කිරීමට පළමු කරුණු ලැයිස්තුවක් රාජ්‍ය පාර්ශවයට ලබා දෙනු ඇත. ඒ කරුණු ලැයිස්තුවට දෙන පිළිතුරු, සම්මුතියේ 19 වැනි වගන්තිය යටතේ රාජ්‍ය පාර්ශවයේ ඊළඟ වාරික වාර්තාව වනු ඇත.